# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2430/17 – 2025 අප්‍රේල් මස 02 වැනි බදාදා – 2025.04.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2209/46 හා 2021.01.07 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2021 අංක 06 හා 2020.12.28 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තර වන එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2209/46 හා 2021.01.07 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2021 අංක 06 හා 2020.12.28 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/16/2018/UDA/355.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කොප්‍රාලේ/ඉඅත්/3/104/UDA.
2025 මාර්තු මස 19 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මෝදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මෝදර (කොට්ඨාස අංක 2 -කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/COL/2019/381 හා 2019.10.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – වරි. අංක 46 සහ 50 ශ්‍රී පඤ්ඤානන්ද මාවත – ප්‍රමාණය: හෙක්. 1.7177**

උතුරට: ශ්‍රී පඤ්ඤානන්ද මාවත හේනමුල්ල පාර සහ හේනමුල්ල පාරේ වරි. අංක G/60 දරන ඉඩම; නැගෙනහිරට: හේනමුල්ල පාර, හේනමුල්ල පාරේ වරි. අංක G/60 සහ 18 දරන ඉඩම් සහ වරි. අංක සොයාගත නොහැකි ධවල සිංහාරාම පන්සල් භූමිය; දකුණට: හේනමුල්ල පාරේ වරි. අංක 18 දරන ඉඩම සහ ධවල සිංහාරාම පාරේ වරි. අංක සොයාගත නොහැකි ධවල සිංහාරාම පන්සල් භූමිය, ධවල සිංහාරාම පාරේ වරි. අංක 15, 80, 82 සහ 84 දරන ඉඩම් සහ ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරි. අංක 42 දරන ඉඩම; බටහිරට: ධවල සිංහාරාම පාරේ වරි. අංක 15, 80, 82 සහ 84 දරන ඉඩම්, ශ්‍රී පඤ්ඤානන්ද මාවතේ වරි. අංක 42 දරන ඉඩම සහ ශ්‍රී පඤ්ඤානන්ද මාවත.

EOG 04 – 0014

1A – G 044125 – 09 (2025/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*